**පූජාපිටිය ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය.**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය.
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
----------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් 2014 වර්ෂයේ දී සභාවට ලබා දී තිබූ නමුත්, මෙතෙක් අයිතිය පවරා නොගත් රු.6,390,000 ක් වටිනා කැබ් රථය හා අයිතිය පවරා නොගත් රු.5,926,000 ක් වටිනා එනසල්මඩ ඉඩම ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.
---------------------------

මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ ඉඩම් හා ගොඩනැගිලි උප ලේඛනයේ සඳහන් ස්ථාවර වත්කම් 29 ක වටිනාකම වූ රු.6,641,295 සමග ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් එම වත්කම්වල වටිනාකම වූ රු.590,150 සැසඳීමේ දී රු.6,051,145 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

#### 1.3.3 ලැබියයුතු ගිණුම්.
--------------------

2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.44,999,227 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.8,951,623 ක් වී තිබුණි.

#### 1.3.4 ගෙවියයුතු ගිණුම්.
--------------------

2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.33,238,913 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.3,283,123 ක් වී තිබුණි.

#### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.
-------------------------------------

ගිණුම් විෂයයන් 02 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.71,505 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) | 19(i)(xi) | විෂයය භාර අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතිය නොලබා සභාව සතු පර්චස් 10 ක ඉඩම් ප්‍රමාණයක් සමෘද්ධි කාර්යාලය ඉදි කිරීම සඳහා කුළී පදනම මත ලබා දී තිබුණි. |
| (ii) | 132(ඒ) | විෂය භාර අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමැතියකින් තොරව පෙර පාසල් ළමුන් සඳහා නිළ ඇඳුම් ලබා ගැනීමට හා බක් මහා උළෙලක් සඳහා අවස්ථා 02 කදී රු.76,785 ක් වැය කර තිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති. | |
| | 218 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | චක්‍රලේඛ.<br>1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/14 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 02 ඡේදය | වසර 05 කට වරක් බදු කුළී සංශෝධනය කළයුතු වුව ද, කඩ කාමර බදු දී වසර 09 ක කාලයක් ගත වී තිබුණද, පූජාපිටිය හා අංකුඹුර වෙළඳ සංකීර්ණවල කඩ කාමර තක්සේරු කර, වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,147,059 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,162,253 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.2,984,806 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය.

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2015.01.01 දිනට | | 2015 වර්ෂය | | | 2015 ලැබීම් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | හිග ශේෂය | ඉදිරියට ලැබීම් | බිල් කිරීම් | අධි ගාස්තු | දූන් වට්ටම් | ඉදිරියට ලැබීම් | හිගයෙන් ලැබීම් | 2015 බිල් කිරීම්වලින් ලැබීම් | 2015.12.31 දිනට හිග ශේෂය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,398,170 | 488,677 | 3,121,344 | 464,311 | 89,686 | 85,199 | 901,593 | 1,623,591 | 2,965,477 |
| බදු කුළී | 466,450 | -- | 1,014,600 | -- | -- | -- | 412,405 | 876,865 | 191,780 |
| බලපත්‍ර ගාස්තු | -- | -- | 1,458,500 | -- | -- | -- | -- | 1,458,500 | -- |
| වෙනත් ආදායම් | 6,993,584 | -- | 12,011,316 | -- | -- | -- | 5,176,662 | 5,619,066 | 8,209,172 |
| එකතුව | | | | | | | | | 11,366,429 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.11,366,429 ක හිග ආදායම් ශේෂයක් නිරීක්ෂණය විය.

**2.2.2 වරිපනම් බදු**

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.2,374,312 ක හිග ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.3,119,161 ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය සියයට 52 ක් පමණ වූ අතර, 2015 දෙසැම්බර් 31 දිනට අය වියයුතු මුදල රු.2,940,437 ක් වී තිබුණි. එම ශේෂයෙන් වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.1,472,719 ක් විය.

**2.2.3 බදු කුළී.**

2015 දෙසැම්බර් 31 දිනට රු.191,780 ක බදු කුළී හිග ශේෂයක් පැවති අතර, එම ශේෂයෙන් වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂය රු.22,230 ක් විය. 2016 මැයි 30 දින වන විට රු.22,230 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.438,422 ක් හා මුද්දර ගාස්තු රු.7,770,750 ක් ලැබියයුතුව පැවතුණි. එම ශේෂයෙන් වසරකට වැඩි කාලයක් හිග හිටි ශේෂය රු.1,778,500 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**3.1 කාර්යය සාධන ඇගයීම.**

සමාලෝචිත වර්ෂයේ රු.12,401,948 ක මුදලක් ස්වයං උත්පාදන ආදායම ලෙස උපයා තිබූ අතර, එයින් සංවර්ධන කටයුතු සඳහා වැය කර තිබූ වටිනාකම රු.1,281,560 කි. මෙය ස්වයං උත්පාදන ආදායමින් සියයට 10.33 ක ප්‍රතිශතයක් විය. මේ අනුව, ප්‍රාදේශීය සභා පනතේ අරමුණු ඉටු කර ගැනීමට හැකි වන අයුරින් ප්‍රතිපාදන යොදා සංවර්ධන කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක පුරප්පාඩු 12 ක් හා අතිරික්ත තනතුරු 15 ක් පැවතුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

පසුගිය වර්ෂ 03 ක් තුළ ගොඩනැගිලි අයදුම්පත් 537 ක් ලැබී තිබූ අතර ඉන් අනුමත කළ සංඛ්‍යාව 380 කි. එම වර්ෂ 03 තුළම අනුකූලතා සහතික 09 ක් පමණක් නිකුත් කර තිබූ අතර, අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් සඳහා අනුකූලතා සහතික නිකුත් කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මකව නොතිබුණි.

**3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු.**

කසළ කළමනාකරණ කටයුතු වෙනුවෙන් යොදා ගැනීම සඳහා සභා බල ප්‍රදේශයේ පිහිටි එනසල්වත්ත නමැති ඉඩමෙන් අක්කර 09 රූඩ් 01 පර්චස් 01.644 ක ප්‍රමාණයක් පවරා ගැනීම සඳහා ඉඩමේ නිරවුල්භාවය නිසි ලෙස සොයා බැලීමකින් තොරව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත රු.250,000 ක් ගෙවා තිබුණි. පසුව එම ඉඩම ඇල්කඩුව වැවිලි සමාගමට අයත් බව පවසා එම ඉඩම සභාවට පවරා නොදීම හේතුවෙන්, ඒ වෙනුවෙන් ගෙවන ලද රු.250,000 ක මුදල සභා අරමුදලට අලාභයක් වී තිබූ අතර, එම ඉඩම පවරා ගැනීමට ද නොහැකි වී තිබුණි.

**3.5 දෘශ්‍ය අක්‍රමිකතා.**

හිටපු සභාපතිවරයා විසින් පෞද්ගලික මුදල් වැය කර වැසි ආවරණ රෙදි 02 ක් (ටෙන්ට් රෙදි) මිල දී ගත් බව සඳහන් කරමින් රු.31,000 ක මුදලක් අක්‍රමික ලෙස සභා අරමුදලින් ලබා ගෙන තිබුණි.

**3.6 හඳුනාගත් අලාභ.**

2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, රු.657,422 ක් වටිනා නළ ළිං උපකරණ 33 ක අයිතම 605 ක ඌනතාවය සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන්ගෙන් අය කිරීමට හෝ විනය ක්‍රියාමාර්ග ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.7 ව්‍යාපෘති ප්‍රමාද කිරිම.**

රු.1,000,000 ක ඇස්තමේන්තුවක් මත වෙලේ කඩේ පොදු වැසිකිළිය හා කියවීම් ශාලාව ඉදි කිරීම 2014 ජූලි 04 දින මුල්ලේගම දකුණ සමෘද්ධි බලකායට පවරා තිබුණි. අධික වර්ෂාව නිසා පිගා ඔය පිටාර ගැලීම හේතුවෙන්, ගොඩනැගිලි ද්‍රව්‍ය විනාශ වීමත් සමග එහි වැඩ අවසන් කිරීමට නොහැකි බව දන්වා කාලය දීර්ඝ කර දෙන ලෙස 2015 ජනවාරි 13 දින ඉල්ලීම් කර තිබුණි. එසේ වුව ද, රු.1,000,000 කට අදාළ එම කර්මාන්තය 2016 වර්ෂයේ දී නිම කර තිබුණ ද, කියවීම් ශාලාවේ ඉතිරි වැඩ කොටස් 2016 මැයි 11 දින දක්වාම නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.8 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.**

සභා බල ප්‍රදේශයේ දිනකට කසළ ටොන් 02 ක් පමණ එකතු වුවත් , තුම්පනේ ප්‍රාදේශීය සභාවට අයත් දික්ඔයවත්ත කසළ අංගනයට ට්‍රැක්ටර් ලෝඩ් 01 ක් පමණක් නිසි කළමනාකරණයකින් තොරව බැහැර කරන අතර, ප්‍රදේශයේ සම්පූර්ණ කසළ ප්‍රමාණයම එකතු කිරීමට ද කටයුතු කර නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**4.1 අයවැය පාලනය.**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 06 ක සියයට 14 සිට සියයට 89 ක් දක්වා ද, වියදම් විෂයයන් 07 ක සියයට 28 සිට සියයට 93 ක් දක්වා ද විචලනයක් නිරීක්ෂණය වු බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

(ආ) වැය විෂයයන් 73 ක් සඳහා සළසා තිබූ රු.1,202,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා ඉතිරි කර තිබූ අතර, වැය විෂයයන් 18 ක් සඳහා සළසා තිබූ සම්පූර්ණ ප්‍රතිපාදිත මුදල වූ රු.595,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඇ) පූර්ව වර්ෂයේ දී සංවර්ධන යෝජනා ලබා ගෙන ප්‍රමුඛතාවය සකස් කර ඉදිරි වර්ෂයේ දී ක්‍රියාත්මක කිරිමට සැළසුම් කරන ව්‍යාපෘතීන් සඳහා විධිමත් පරිදි කාර්මික නිලධාරීන්ගෙන් ඇස්තමේන්තු ලබා ගෙන එකී ඇස්තමේන්තුගත වටිනාකම අනුව අයවැය ඇස්තමේන්තු පිළියෙළ කළයුතු වුවත්, එසේ කිරීමකින් තොරව මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස රු.1,400,000 ක දළ වටිනාකම් යොදා අයවැය ඇස්තමේන්තු පිළියෙළ කරවා සම්මත කර ගෙන තිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය.**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

සභාව සතු වාහන 04 ක් වසරකට අධික කාලයක සිට ක්‍රියා විරහිත වී ඇති අතර, තවත් වාහන 03 ක් නිෂ්කාර්යව ගාල් කර තිබුණි.

**5. පද්ධති හා පාලනය.**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය.
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ණයගැති හා ණයහිමි පාලනය
(ඉ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය.
(ඊ) වත්කම් කළමනාකරණය.